ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## විකසිත් භාරත් ධාවන තරඟය, 2025

කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ඉන්දීය රජයේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවතින MY භාරත් සහ ඉන්දීය සංස්කෘතික සංගමය සමඟින් එක්ව සංවිධානය කරන ලද විකසිත් භාරත් ධාවන තරඟය 2025 සැප්තැම්බර් 28 වන දින කොළඹ, ගාලු මුවදොර පිටියේදී පැවැත්විණ. එදින ලොව පුරා ස්ථාන 150ක පැවති මෙම වැඩසටහන සැබවින්ම සේවය, ශාරීරික යෝග්‍යතාවය සහ තිරසාරභාවය පිළිබඳ ගෝලීය සැමරුමක් විය. මෙම ධාවන තරඟය වර්ෂ 2047 වන විට සංවර්ධිත ඉන්දියාවක් හවෙත් විකසිත් භාරත් යන අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ දැක්ම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරින් මුල් බැසගත් මිත්‍රත්වය සහ හොඳහිත අවධාරණය කළේය.

2. කොළඹ පැවති, කිලෝ මීටර් 5ක මෙම ධාවන තරඟය සඳහා ඉන්දීය ඩයස්පෝරාව, ශ්‍රී ලාංකික පුරවැසියන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, කොළඹ පදිංචිකරුවන් සහ ඉන්දියාවේ මිතුරන් රැසක් මහත් උද්‍යෝගයකින් සහභාගී වූහ. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ, බලශක්ති අමාත්‍ය කුමාර ජයකොඩි, කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත, තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය එරංග ගුණසේකර, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය එරංග වීරරත්න සහ ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය සුගත් තිලකරත්න යන මහත්වරුන්, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්, සිනමා රංගන ශිල්පීන් සහ ශිල්පිණියන් සහ සමාජ මාධ්‍ය බලපෑම්කරුවන් රැසක් සමඟ ධාවන තරඟය සඳහා එක් විය. මේ සඳහා 2000කට අධික පිරිසක් සහභාගී වූහ.

3. “ජාතියට **සේවය** කිරීම උදෙසා” යන තේමාව යටතේ පැවති මෙම ධාවන තරඟය එකමුතුභාවය පිළිබඳ ප්‍රබල පණිවිඩයක් ලබා දුන්නේය. ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වැඩසටහනක් පමණක්ම නොවූ මෙය සේවය පිළිබඳ පරමාදර්ශයන් සැමරූ අවස්ථාවක් ද විය. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ස්වයං රඳාපැවැත්ම, අන්තර්ග්‍රහණීයත්වය සහ පාරිසරික වගකීම සඳහා අග්‍රාමාත්‍යතුමාගේ අධිෂ්ඨානය ඉස්මතු කළ අතර ඉන්දියාව උදෙසා තව තවත් කැප වන ලෙස ඉන්දීය ඩයස්පෝරාවෙන් ඉල්ලා සිටියේය.

4. ධාවකයන් 1500ක්, ස්වේච්ඡා සේවකයන් 300ක් මෙන්ම විවිධ ප්‍රජා සංවිධාන රැසක් සහභාගී වූ මෙම වැඩසටහන අතිශය සාර්ථක අන්දමින් පැවති අතර එතුළින් දරෙට වඩාත් සමීප කළේය. එසේම, එය වර්ධනය, නව්‍යකරණය සහ අන්‍යෝන්‍ය සෞභාග්‍යය උදෙසා දරෙටහි අභිලාෂයන් තවත් ශක්තිමත් කළේය.

විකසිත් භාරත් සහ **ආත්මනිර්භර්** භාරත් සඳහා ප්‍රතිඥාව

5. කිලෝ මීටර් 5ක ධාවන තරඟයෙන් අනතුරුව, ඉන්දීය ඩයස්පෝරා සාමාජිකයෝ වර්ෂ 2047 වන විට සංවර්ධිත ඉන්දියාවක් බවට පත්වීමේ ඉන්දියාවේ ප්‍රයත්නයන්ට කැපවෙමින් සාමූහිකව විකසිත් භාරත් සහ **ආත්මනිර්භර්** භාරත් ප්‍රතිඥාව ලබා දුන්හ.

6. විකසිත් භාරත් ධාවන තරඟයෙන් අනතුරුව මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීහු ස්වච්ඡතෝත්සව් 2025 සහ පිරිසිදු සහ හරිත වටපිටාවක පණිවිඩය අවධාරණය කරමින් ගාලු මුවදොර පිටිය පවිත්‍ර කළහ.

**ඒක් පේඩ්** මා කේ නාම්: හරිත පරිසරයක් සඳහා කැපවීමක්

7. ධාවන තරඟයට අමතරව, ඉන්දීය මහ කොමසාරිස්තුමා අග්‍රගණ්‍ය ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයකු වන අරවින්ද ද සිල්වා මහතා සමඟ සැප්තැම්බර් 26 වන දින **"ඒක් පේඩ්** මා කේ නාම්" (මව වෙනුවෙන් පැළයක්) වැඩසටහන යටතේ පෞද්ගලික වගකීම සහ පාරිසරික තිරසාරත්වය අතර සම්බන්ධතාවය ඉස්මතු කරමින් ඉන්දියා හවුස් පරිශ්‍රයේ පැළ සිටුවීම ද සිදු කළේය. මෙය වඩා හරිත ලෝකයක් ගොඩනැගීම සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොදු කැපවීම සංකේතවත් කළේය.

ඩයස්ප**ෝරා** නියැලීම සහ ග**ෝලීය** හවුල්කාරිත්වයන්

8. විකසිත් භාරත් ධාවන තර**ඟය** ශ්‍රී ලංකාවේ ඉන්දීය ඩයස්පෝරා සංවිධාන සමඟ සහයෝගයෙන් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ප්‍රජා කණ්ඩායම්, සංස්කෘතික සංගම් සහ ක්‍රීඩා ලෝලීන් රැසක් කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය. තව ද මෙම ධාවන තරඟය "ලොවම එක් පවුලක්" හෙවත් වාසුධායිව කුටුම්භකම් යන සංකල්පය අවධාරණය කළේය. ඉන්දීය ඩයස්පෝරා සාමාජිකයෝ සහ ඉන්දියාවේ මිතුරෝ ඉන්දියාව සමඟ මිත්‍රත්වයේ ශක්තිමත් බැඳීම් පිළිබිඹු කරමින් එක්ව ධාවනයේ යෙදුණහ. ඩයස්පෝරා සාමාජිකයන් සඳහා කොන්සියුලර් සහය සහ ඉන්දීය රජයේ වැඩසටහන් පිළිබඳව තොරතුරු ලබා දීම සඳහා ඩයස්පෝරා තොරතුරු කුටියක් ද පැවැත්විණ.

ග**ෝලීය** සැමරුමක සුවිශ**ේෂී** සලකුණක්

9. ලොව පුරා නගර 150ක එකම දිනක පැවති විකසිත් භාරත් ධාවන තර**ඟය 2025** එකමුතුභාවය, ඔරොත්තු දීමේ හැකියාව සහ බදො හදා ගන්නා වගකීම පිළිබඳ ප්‍රබල පණිවිඩයක් ලබා දුන්නේය.

***

**කොළඹ**

***2025*** සැප්තැම්බර් ***28***